(මක්කාහ්) ජයග්රනහණයෙන් පසු ව හිජ්රතයක් (නික්ම යෑමක්) නොමැත. එනමුත් ජිහාදය හා චේතනාව ඇත. නුඹලා පලවා හරිනු ලබන්නෙහු නම් එවිට නුඹලාද පලවා හරිනු.

ෆත්හ් මක්කාහ් හෙවත් මක්කාහ් ජයග්රහණය ලැබූ දින අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලයිහි වසල්ලම්- පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. (මක්කාහ්) ජයග්රහණයෙන් පසු ව හිජ්රතයක් (නික්ම යෑමක්) නොමැත. එනමුත් ජිහාදය හා චේතනාව ඇත. නුඹලා පලවා හරිනු ලබන්නෙහු නම් එවිට නුඹලාද පලවා හරිනු. මක්කාහ් ජයග්රහණය ලැබූ දින එතුමාණන් තව දුරටත්, “නියත වශයෙන්ම අල්ලාහ් අහස් හා මහපොළොව මැවූ දින (පටන්) මෙය පාරිශුද්ධ කළේය. අල්ලාහ්ගේ පාරිශුද්ධ භාවයෙන් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන තෙක් මෙය පාරිශුද්ධ ව පවතින්නකි. මට පෙර කිසිවකු වෙත මෙහි යුද වැදීමට අනුමත නොවීය. මට පවා දහවල් කාලයේ හෝරාවක් හැර අනුමත නොවීය. අල්ලාහ්ගේ පාරිශුද්ධභාවයෙන් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින දක්වා පාරිශුද්ධ ව පවතී. එහි කටු පඳුරු කපා හරිනු නොලැබේ. එහි දඬයම් සතුන් පලවා හරිනු නොලැබේ. එහි මග හැරුණු භාණ්ඩයක් එය හඳුනන අයකු මිස අහුලා නොගනු ඇත. එහි ඇති පැළෑටි විනාශ කරනු නොලැබේ.“ යැයි පැවසූහ. එවිට අබ්බාස් තුමා, “නමුත් අල්ලාහ්ගේ දූතයාණනි! ‘ඉද්හිර්’ හෙවත් ශාඛ වර්ගය හැර. හේතුව, නියත වශයෙන්ම එය ඔවුන් දැල්වීම සඳහා හා
ඔවුන්ගේ නිවෙස්හි වියන් තැනීම සඳහා වූවක්“ යැයි විමසා සිටි විට එසේ නම් ඉද්හිර්
නම් ශාඛ වර්ගය හැර යැයි පැවසූහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් දන්වා සිටියි. නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා මක්කා ජයග්රහණ දිනයේ දේශනා කරන්නට විය. එවිට එතුමා හිජ්රතයක් නොමැත, එනම් මක්කාවේ සිට හිජ්රතයක් නොමැත යැයි පවසා සිටියහ. හේතුව එය ඉස්ලාමීය නගරයක් වූ බැවිනි. නමුත් අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම ඉතිරිව පවතී. ජිහාදය වෙත ඇරයුම් කරනු ලබන්නන් හට අල්ලාහ්ට, ඔහුගේ රසූල්වරයාට හා ප්රධානීන්ට අවනත වී පිටත් වන මෙන් නියෝග කළහ. පසුව මක්කාවේ ගරුත්වය පිළිබඳ මෙනෙහි කළේය. එය අල්ලාහ් අහස් හා මහපොළොව මැවූ දා පටන් විය. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාට පෙර කිසිවකුට හෝ එය අනුමත නොවී්ය. එතුමාට පසුවද කිසිවකුට අනුමත නොවන්නේය. එතුමාට දහවල් කාලයේ හෝරාවක් පමණක් අනුමත කරන ලදී. පසුව නැවතත් එහි ගරුත්වය ලැබිණ. පසුව මක්කාවේ ගරුත්වය පිළිබඳ මෙනෙහි කළහ. හරම් සීමාව තුළ කටු පදුරු උගුලා නොදමන මෙන්ද එහි ඇති දඬයම් සතුන් පළවා නොහරින මෙන්ද වැටුණු භාණ්ඩයක් එය තමන් හඳුනන්නේ නම් මිස අහුලා නොගන්නා මෙන්ද එහි ඇති පදුරු ඉවත් නොකරන මෙන්ද නියෝග කළහ. ඒ අතුරින් ඉද්හිර් නම් පැළෑටි වර්ගය වෙන් කළේය. හේතුව එය මක්කා වාසීන්ගේ යහපත පිණිස තිබෙන්නක් වන අතර කම්මල්කරුවන් තම වැඩ සඳහා ගිනි දල්වා ගැනීමට ද එය භාවිතා කරන බැවිනි.